**උ.ප.රා.සේ.කො.ස චක්‍රලේඛ අංක:.22/2026**

මගේ අංකය:NP/07/10/01/228
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත
යාපනය
2026.08.17

ප්‍රධාන ලේකම්
ආණ්ඩුකාර ලේකම්
අමාත්‍යාංශ ලේකම්වරුන්
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
උතුරු පළාත

## උතුරු පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ විමර්ශන නිලධාරි III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2026

උතුරු පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක **NP/17/Cad/04/19 vol-ii** දරණ 2025.11.17 දිනැති ලිපිය මගින් නිර්දේශ කරන ලදුව, උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අංක **G/NPC/A15/Approval/2025/021** දරණ 2025.12.02 දිනැති ලිපිය මගින් අනුමත කරන ලද, උතුරු පළාතේ මුදල්, ක්‍රමසම්පාදන සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක NP/05/01/GEN/01 දරණ 2025.12.11 දිනැති ඉල්ලීම් ලිපිය ප්‍රකාරව උතුරු පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ විමර්ශන නිලධාරි **III** ශ්‍රේණියේ පවතින පුරප්පාඩු එකක් (01) සඳහා බඳවා ගැනීම වෙනුවෙන් පැවැත්වෙන සීමිත තරඟ විභාගය උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් **2026 වර්ෂයේ ඔක්තෝබර්** මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2026.09.04** වේ.

### 02. බඳවා ගැනීමේ සේවා කොන්දේසි

02.1 2013.01.01 වැනි දින සිට බලපැවැත්වෙන වන පරිදි උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද උතුරු පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ විමර්ශන නිලධාරි සේවයට අදාළ සේවා ව්‍යවස්ථා සංග්‍රහය මගින් පනවා ඇති නියමයන් හා කොන්දේසි, ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1817/30 දරණ 2013.07.03 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවය සඳහා වන කාර්ය පටිපාටික රීති සහ මෙම තනතුර හා සම්බන්ධ කලින් කලට නිකුත් කරනු ලබන නියමයන්, විධිවිධාන යනාදියට යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයන් **විමර්ශන නිලධාරි තනතුරේ III ශ්‍රේණියට** පත්කරනු ලැබේ.

02.2 මෙම තරඟ විභාගයෙන් සමත්වන අපේක්ෂකයන් පත්වීම් දින සිට වසරක වැඩ බැලීමේ කාලසීමාවට යටත් කිරීමෙන් අනතුරුව, **විමර්ශන නිලධාරි III ශ්‍රේණියේ තනතුරේ ස්ථිර** කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකි. බඳවාගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි **විමර්ශන නිලධාරි තනතුරේ III ශ්‍රේණියට** පත් වූ දින සිට වසර **තුනක් (03)** ඇතුළත පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

02.3 මෙම සේවය ස්ථානමාරුවලට යටත්වන සේවයකි. එබැවින් මෙම තනතුරට පත්කරනු ලබන අයදුම්කරුවන් "උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුය" යන කොන්දේසියට යටත් විය යුතුය.

02.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 සහ මේ සම්බන්ධයෙන් යථා කාලයේ දී නිකුත් කරනු ලබන චක්‍රලේඛවලට අනුව පත්වීමේ දිනයේ සිට **වසර 03 ක්** අවසන් වීමට ප්‍රථම නියම කර ඇති දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

02.5 සීමිත තරඟ විභාගය මගින් බඳවා ගනු ලබන සේවක සංඛ්‍යාව **එකකි (01).** පත්වීම් සංඛ්‍යාව සහ ක්‍රියාත්මක වන දිනය යනාදිය පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබයි. නිවේදනය කරනු ලැබූ මෙම පුරප්පාඩුව සම්පූර්ණ නොකර සිටීමේ බලය පත්වීම් බලධාරියා සතුය.

## 03. වැටුප් පරිමාණය

2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක **10/2025** ප්‍රකාර **MN 4 -2025** වැටුප් කේතය අනුව **විමර්ශන නිලධාරි III වන ශ්‍රේණියේ** තනතුර සඳහා ඒකාබද්ධ වැටුප් පරිමාණය **රු.53,060 - 10 X 800/= - 11 X 1,190/= - 10 X 1,320/= - 5 X 1,350/= රු.94,100/= ක් වේ.** (මෙම වැටුප් පරිමාණයේ සිව්වන පියවරට එළඹීමට ප්‍රථම පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය). කෙසේ වෙතත් ඉහත සඳහන් චක්‍රලේඛයේ **III වන උපලේඛනයෙහි** සඳහන් විධිවිධාන පරිදි නියම කරන ලද වැටුප් මෙම තනතුර සඳහා ගෙවනු ලැබේ.

## 04. සුදුසුකම්

04.1 <u>**අධ්‍යාපන සුදුසුකම්**</u>

අ.පො.ස. (උ / පෙළ) විභාගයෙන් වාණිජ්‍ය අංශයෙන්, පැරණි විෂයය නිර්දේශයට අනුව නම් විෂයයන් හතරකින් (04) හෝ නව විෂයය නිර්දේශයට අනුව නම් විෂයයන් තුනකින් (03) සමත්ව තිබිය යුතුය.

**හෝ**

අ.පො.ස. (සා / පෙළ) විභාගයෙන් **ගණිතය, සිංහල / දෙමළ සමග වාණිජ්‍ය හා ගිණුම්** යන විෂයයන් ඇතුළත්ව විෂයයන් **හතරකට (04)** සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් **හයකින් (06)** එක් වරකදී සමත්ව තිබිය යුතුය.

**සහ**

පහත සඳහන් කුමන හෝ විභාගයකින් **සමත්ව** තිබිය යුතුය.

1. රජයේ තාක්ෂණ ආයතනයේ (Government Technical Institute) ගිණුම්කරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා (Higher National Diploma in Accountancy) / ගිණුම්කරණය පිළිබඳ ඩිප්ලෝමා (Diploma in Accountancy) පාඨමාලාවේ දෙවන වසරේ විභාගය.

2. ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලය (Sri Lanka Technical College) / රජයේ තාක්ෂණික ආයතනයෙන් (Government Technical Institute) **විගණනය** (Auditing) විෂයයක් ලෙස හදාරා ලබාගත් ව්‍යාපාර අධ්‍යාපනය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (National Diploma in Business Studies)

3. රජයේ තාක්ෂණික ආයතනය (Government Technical Institute) මගින් පිරිනමනු ලබන වාණිජ විද්‍යාව පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා (Higher National Diploma in Commerce) / වාණිජ විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ (Diploma in Commerce) දෙවන වසරේ විභාගය.

4. කළමනාකරණ ගිණුම්කරණ ආයතනයේ (ලන්ඩන්) අවසාන විභාගය

5. ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරිවරයන්ගේ ආයතනයේ (ICASL) මූලික විභාගය

04.2 **පළපුරුද්ද**

අයදුම්කරු උතුරු පළාතේ පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ වසර **දහයකට (10)** නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

**හෝ**

අයදුම්කරු පළාත් රාජ්‍ය සේවයේ **වසර පහක (05) පළපුරුද්දක් සමග ගිණුම්කරණය විෂයය** ඇතුළත් උපාධියක් ලබා තිබිය යුතුය.

04.3 **ශාරීරික යෝග්‍යතාවය**

අයදුම්කරු උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක තම තනතුරට අදාළ රාජකාරි ඉටුකිරීමට හැකි යහපත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් හෙබි පුද්ගලයෙකු විය යුතු අතර, මනා හැසිරීමකින් යුතු අයෙකු විය යුතුය.

04.4 **වයස**: වයස් සීමාව අදාළ නොවේ.

## 05. බඳවා ගැනීමේ පරිපාටිය

05.1 අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ ඊට පෙර අවශ්‍ය **සියලු සුදුසුකම්** සපුරා තිබිය යුතුය. ප්‍රතිඵල අපේක්ෂාවෙන් ඉදිරිපත් කරන සියලුම අයදුම්පත් පූර්ව දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05.2 ලිඛිත විභාගය මගින් කුසලතාවය පදනම් කරගෙන බඳවා ගන්නා අවස්ථාවේ දී බලපැවැත්වෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, සේවා ව්‍යවස්ථාව, ජාතික සහ පළාත් ප්‍රතිපත්ති යනාදිය අනුව **විමර්ශන නිලධාරී III** ශ්‍රේණියට බඳවා ගනු ලැබේ. මෙම චක්‍රලේඛය මගින් ඉල්ලා සිටින සියලුම සුදුසුකම්, ඒවා තහවුරු කෙරෙන ලියකියවිලි සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂා කරනු ලැබේ. මෙම සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු කිසිවක් ලබාදෙනු නොලැබේ. මෙම සම්මුඛ පරීක්ෂණයේ දී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් මෙම තනතුර සඳහා වූ හිමිකම් අවලංගු කරනු ලැබේ.

05.3 ඉහත සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන අයදුම්කරුවන් අතරින්, ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් ලැබූ මුළු ලකුණු සංඛ්‍යාවේ කුසලතා අනුපිළිවෙල අනුව පත්වීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයට තෝරා ගනු ලැබේ.

## **06.** විභාග ගාස්තුව

අයදුම්කරු, විභාග ගාස්තු ලෙස **රු.500/=** මුදලක් උතුරු පළාතේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකින් **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත"** යන නමට **යාපනය ප්‍රධාන තැපැල් කාර්යාලයෙන්** මාරුකළ හැකි වන පරිදි මුදල් ඇණවුමකින් ගෙවා, අදාළ කුවිතාන්සිය අයදුම්පතෙහි අදාළ කොටුවේ නොගැළවෙන පරිදි අලවා එවිය යුතුය. කුමන හේතුවක් නිසා හෝ මෙම ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම ගාස්තුව වෙනත් විභාග සඳහා මාරු කිරීමට ද අනුමත කරනු නොලැබේ.

## **07.** අයදුම්කිරීමේ පිළිවෙල

07.1 මෙම නිවේදනය සමග අමුණා ඇති අයදුම්පත www.np.gov.lk උතුරු පළාත් නිල වෙබ් අඩවියට පිවිස බාගත කරගෙන සම්පූර්ණ කළ අයදුම්පත, **අයදුම්පත් භාරගන්නා අවසාන දින හෝ ඊට පෙර** ලැබෙන පරිදි **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමුකළ යුතුය.

07.2 අයදුම්පත බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **" NP/07/10/01/228"** යනුවෙන් සඳහන් කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ නිවැරදිව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07.3 ඉල්ලුම්පත්‍රයේ පිටපතක් තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. ඉල්ලුම්පත්‍රයේ පිටපත් සහ ප්‍රගමන පිටපත් යනාදිය භාරගනු නොලැබේ. විභාගය සඳහා ප්‍රවේශ පත්‍රය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් එවනු ලැබේ. **විභාග ප්‍රවේශ පත්‍රය එවීමෙන්, අයදුම්කරු සියලු සුදුසුකම් සපුරා ඇති බවට අදහස් නොකෙරේ.**

07.4 අයදුම්පත් ඉදිරිපත් කරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ලැබුණු බවට කිසිදු දැනුම්දීමක් කරනු නොලැබේ. තවද අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර, ඉල්ලා ඇති සුදුසුකම් සම්පූර්ණ නොකරන අයදුම්පත් කිසිදු පෙර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබිය හැක.

07.5 ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 05 කට වත් පෙර විභාගය ප්‍රවේශ පත්‍රය නොලැබුණේ නම්, ඒ බව පහත සඳහන් විස්තර සහිතව **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට දැන්විය යුතුය. (දුරකතන අංකය - **021-2219939** / ෆැක්ස් අංකය - **021-2219940** / විද්‍යුත් තැපැල - **examppscnp@gmail.com**)

- විභාගයේ නම
- අයදුම්කරුගේ සම්පූර්ණ නම
- ජාතික හැඳුනුම්පත් අංකය
- අයදුම්කරුගේ තැපැල් ලිපිනය
- අයදුම්කරුගේ විද්‍යුත් තැපැල් ලිපිනය
- අයදුම්පතේ පිටපතක්
- අයදුම්පත තැපැල් කළ තැපැල් කාර්යාලය, ලියාපදිංචි තැපෑලේ අංකය සහ දිනය
- විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපතේ සහතික කළ පිටපතක්

## 08. පුද්ගල අනන්‍යතාව තහවුරු කිරීම

08.1 අයදුම්කරුවන් තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම විභාග ශාලාධිපති සෑහීමකට පත්විය හැකිවන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලේඛනවලින් කුමන හෝ එකක් පිළිගනු ලැබේ.

(i). පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

(ii). වලංගු ශ්‍රී ලංකා විදේශ ගමන් බලපත්‍රය

(iii). වලංගු ශ්‍රී ලංකා රියදුරු බලපත්‍රය

ඉහත සඳහන් ලියවිලිවලින් අතරින් එකක් හෝ විභාගයට පෙනී සිටීමේ දී ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය **"උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ "** අභිමතය පරිදි අවලංගු කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන රෙගුලාසිවලට අයදුම්කරුවන් යටත් විය යුතුය. එම රෙගුලාසි උල්ලංඝණය කළහොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන දඬුවමකට යටත් විය යුතුය.

08.2 තවද, අයදුම්කරුවන්ගේ අනන්‍යතාවය තහවුරු කර ගත හැකි පරිදි මුහුණ සහ ඉලෙක්ට්‍රෝනික උපාංග පැළඳ නොසිටින බව තහවුරු කරගැනීම සඳහා කන් දෙකම ආවරණය නොකර විභාග ශාලාවට ඇතුළු විය යුතුය. තවද, එසේ තහවුරු කරගැනීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කරනු නොලැබේ. තවද, විභාග ශාලාවට ඇතුළත්වූ මොහොතේ සිට විභාගය අවසන් වී විභාග ශාලාවෙන් පිටත්ව යන තුරු අයදුම්කරුගේ අනන්‍යතාවය තහවුරු වන ආකාරයෙන් මුහුණ සහ කන් දෙක ආවරණය නොකර සිටිය යුතුය.

## 09. අසත්‍ය තොරතුරු සඳහා දඬුවම්

අයදුම්කරු තම ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කිරීමේ දී ඉතා සැළකිලිමත්ව නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුය. මෙම විභාගයේ රෙගුලාසිවලට අනුව කිසියම් අයදුම්කරුවෙකු විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන විට හෝ විභාගයෙන් පසුව කුමන හෝ අවස්ථාවක සුදුසුකම් නොමැති අයෙකු බව අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය එම අවස්ථාවේ දී ම අවලංගු කරනු ලැබේ. අයදුම්කරු ඉදිරිපත් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය බව අනාවරණය වන කුමන හෝ අවස්ථාවක හෝ ඔහු/ඇය පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ඇත.

## 10. අත්සන සහතික කිරීම

සෑම අයදුම්කරුවෙකුම තමන්ගේ අත්සන සහතික කිරීම අනිවාර්යය වේ. අයදුම්කරු තම ආයතන ප්‍රධානියා හෝ ආයතන ප්‍රධානියා වෙනුවෙන් අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු මගින් තම අත්සන සහතික කරවා ගත යුතුය.

## 11. විභාග පරිපාටිය

මෙම ලිඛිත පරීක්ෂණය පහත සඳහන් **ප්‍රශ්න පත්‍ර 02 න්** සමන්විත වන අතර, මෙම විභාගය සිංහල සහ දෙමළ භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අයදුම්කරුවෙකු තමන්ට අදාළ භාෂා මාධ්‍ය තෝරාගත යුතු අතර, විභාගයට අදාළ සියලුම ප්‍රශ්න පත්‍රවලට එම භාෂා මාධ්‍යයෙන් පිළිතුරු සැපයිය යුතුය. අයදුම් කරන ලද භාෂාව පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| අංකය | ප්‍රශ්න පත්‍රය | විෂයය අන්තර්ගතය | කාලය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | අභියෝග්‍යතාවය (General Aptitude) | මෙම ප්‍රශ්න පත්‍රය අයදුම්කරුගේ තර්කන හැකියාව සහ සාමාන්‍ය බුද්ධිය, අවබෝධය, දෘශ්‍ය නිරීක්ෂණය (Visual Observation), කේතනය (Coding) හා විකේතනය ( Decoding), සංඛ්‍යාත්මක හැකියාව සහ භාෂා ප්‍රවීණතාවය පරීක්ෂා කෙරෙන ප්‍රශ්නවලින් සමන්විත ය. | පැය 01 | 100 |
| 02 | කාර්යාල හා ගිණුම් ක්‍රම (Office and Accounting System) | 1. ද්විත්ව සටහන් මූලධර්ම භාවිතය (Principles of Double Entry) සහ වෙළඳ ගිණුම, ලාභ-අලාභ ගිණුම (Profit and Loss), විසර්ජන ගිණුම (Appropriation Accounts) හා ශේෂ පත්‍රය (Balance Sheet) සකස් කිරීම ඇතුළු ගිණුම් තැබීම.<br><br>2. ජර්නල භාවිතය (Use of Journal), සුළු මුදල් පොත (Petty Cash) සහ අග්‍රිම (Imprest) වාර්තා පවත්වාගෙන යාම, බැංකු සැසඳුම් ප්‍රකාශන (Bank Reconciliation Statements), ක්ෂයවීම් (Depreciation), සංචිත (Reserves), නිදන් අරමුදල (Sinking Fund), අවිනිශ්චිත ගිණුම් (Suspense Accounts), සහ අත්තිකාරම් ගෙවීම් (Payment of Advance), මෙන්ම ලැබීම් හා ගෙවීම් ගිණුම් (Receives and Payments Accounts)<br><br>3. විගණනයේ මූලික මූලධර්ම, මුදල් ගිණුම්කරණ මූලධර්ම (Principles of Cash Accounts), කාර්යාල සංවිධානය (Office Organization) සහ ලිපිගොනු පද්ධති (Filing System) | පැය 02 | 100 |

<u>සටහන</u>

මෙම විභාගය තරඟ විභාගයක් වන හෙයින් සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් ලැබීමට නම් එක් එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් අවම වශයෙන් **සියයට හතළිහක්වත් (40%)** අපේක්ෂකයින් විසින් ලබාගත යුතුය. සම්මුඛ පරීක්ෂණයේ දී මෙම තරඟ විභාගයෙන් අයදුම්කරුවන් ලබාගත් මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල (Merit Order) සළකා බලනු ලැබේ.

## 12. විභාග ප්‍රතිඵල

අයදුම්කරුවන්ගේ සම්පූර්ණ විභාග ප්‍රතිඵල උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් www.np.gov.lk උතුරු පළාත් සභාවේ නිල වෙබ් අඩවියෙහි පළකරනු ලබන අතර, තම තමන්ගේ පුද්ගලික විභාග ප්‍රතිඵල ද www.np.gov.lk ⟶ **Exams & Recruitments** ⟶ **Results** යන සබැඳිය මගින් බලාගැනීමටත්, භාගත කිරීමටත් හැකිය.

**සැළකිය යුතුය:-**

(i). මෙම චක්‍රලේඛයේ විධිවිධාන සලසා නොමැති මොනයම් හෝ කරුණක් පිළිබඳව උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වේ.

(ii). මෙම විභාගය පැවැත්වීම හෝ අවලංගු කිරීම පිළිබඳ සම්පූර්ණ බලය උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් සතුය.

(iii). මෙම නිවේදනයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් කිසියම් පැහැදිළි කරගැනීමක් අවශ්‍ය වන්නේ නම් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග අංශයේ දුරකතන අංක 021-2219939 සමග සම්බන්ධ වන්න.

(iv). මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක දෙමළ මාධ්‍ය නිවේදනය බලාත්මක වන බව සැළකිය යුතුය.

(v). මෙම විභාගය පිළිබඳ නිවේදනය www.np.gov.lk ⟶ **Exams and Recruitments** ⟶ **Advertisement** ⟶ **2026** උතුරු පළාත් සභාවේ නිල වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකිය.

**ආල්වාප්පිල්ලෛ සිරි**
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත
**2026.08.17**